# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 2171635 — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1466 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 14/09/2024 පැය 0555

## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයක් - දෙයියන්දර පොලිස් වසම.

2024.09.13 වන දින උදෑසන කාලයේ දෙයියන්දර පොලිස් වසමේ අතපත්තුකන්ද ප්‍රදේශයේ කාන්තාවකට තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කර ඇති බවට දෙයියන්දර පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 42 ක් වූ දෙයියන්දර ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

පවුල් ආරවුලක් දුරදිග යාම හේතුවෙන් ස්වාමි පුරුෂයා විසින් බිරිඳට තියුණු ආයුධයකින් පහරදීම හේතුවෙන් මෙම ඝාතනය සිදුව ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය මාතර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ඝාතනය සිදුකල වයස අවුරුදු 43ක් වූ සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර දෙයියන්දර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. වරදක් කල හැකි ආයුධ සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කළුතර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය .

2024.09.13 වන දින උදෑසන කාලයේ කළුතර දකුණ පොලිස් වසමේ කිතුලාව ප්‍රදේශයේදී කළුතර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **වරදක් කල හැකි ආයුධ වන මන්නා පිහි 10ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන කළුතර දකුණ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 26 හා 30 යන වයස්වල පසුවන කිතුලාව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

කළුතර දකුණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. අවශ්‍ය කරන සැකකරුවෙකු අත්අඩංගුවට - කොට්ඨාස අපරාධ විමර්ශන අංශය පෑලියගොඩ.**

2024.09.13 වන දින සවස් කාලයේ කිරිබත්ගොඩ පොලිස් වසමේ නාහේනවත්ත ප්‍රදේශයේදී පෑලියගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරින්ට ලද තොරතුරකට අනුව ගෙවල් බිඳ දේපල සොරකමට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන වත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු දිවයිනේ ලියාපදිංචි අපරාධකරුවෙකු වන අතර කිරිබත්ගොඩ, වත්තල, රාගම පොලිස් වසම්වල සිදුවූ ගෙවල් බිඳ දේපල සොරකම් කිරීම් හතරකට සම්බන්ධ ඇඟිලි සටහන් වාර්තා මඟින් හඳුනාගත් සැකකරුවෙකු වන අතර සැකකරුට එරෙහිව කඩවත පොලිස් වසමේ සිදුවූ මනුෂ්‍ය ඝාතනයක් හා රාගම පොලිස් වසමේ සිදුවූ ගෙවල් බිඳ දේපල සොරකම් කිරීමට අදාල නඩු දෙකක් මේ වන විට ගම්පහ මහාධිකරණය හා ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වෙමින් පවතින බව විමර්ශනයේදී අනාවරණය වී ඇත.

පෑලියගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන අංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. හෙරොයින් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.**

2024.09.13 වන දින රාත්‍රී කාලයේදී, ගල්කිස්ස පොලිස් වසමේ කටුකුරුඳුවත්ත ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 07 මිලිග්‍රෑම් 200 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි

**05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කළුතර අපරාධ කොට්ඨාසය.**

2024.09.13 වන දින රාත්‍රී කාලයේදී වැල්ලම්පිටිය පොලිස් වසමේ කොළොන්නාව ප්‍රදේශයේදී කළුතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 180 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වැල්ලම්පිටිය පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වන කොළොන්නාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වැල්ලම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මට්ටක්කුලිය පොලිස් ස්ථානය.**

2024.09.13 වන දින රාත්‍රී කාලයේදී මට්ටක්කුලිය පොලිස් වසමේ අලිවත්ත ප්‍රදේශයේදී මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වන මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මට්ටක්කුලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකාරියක් අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.09.13 වන දින රාත්‍රී කාලයේදී මට්ටක්කුලිය පොලිස් වසමේ කදිරානවත්ත ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 210 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 29 ක් වන මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුර.**

2024.09.13 වන දින රාත්‍රී කාලයේදී රාජාංගනය පොලිස් වසමේ කැල්ල කලාඔය ප්‍රදේශයේදී නීති විරෝධී වත්කම් කොට්ඨාසයෙන් ලබාදුන් තොරතුරකට අනුව පොලිස් විශේෂ කාර්ය බලකා පුත්තලම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **නිවසක් තුල සඟවා තිබූ ගංජා පාර්සල් 94ක් සමග සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන රාජාංගනය පොලිසිය වෙත ඉදිරිපත් කර ඇත. ගංජා තොගය කිරා මැන බැලීමේදී කිලෝ 204 ග්‍රෑම් 250ක් බවට අනාවරණය වී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන කලාඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

රාජාංගනය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**09. රිවොල්වර අවියක් හා හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන අංශය.**

2024.09.13 වන දින උදෑසන කාලයේ බුත්තල පොලිස් වසමේ පරන බුත්තල පාර ප්‍රදේශයේදී මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත සැකකටයුතු ත්‍රීරෝද රථයක් පරික්ෂා කර **විදේශ රටක නිෂ්පාදිත රිවොලවර අවියක්, එම උණ්ඩ 04ක් හා හෙරොයින්**

**ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 100ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන සෙල්ලකතරගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන අංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 10. විදෙස් රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මාතලේ පොලිස් ස්ථානය.

2024.09.13 වන දින උදෑසන කාලයේ මාතලේ පොලිස් වසමේ හරස්ගම ප්‍රදේශයේදී මාතලේ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **විදේශ රටක නිෂ්පාදිත බෝර 12 වර්ගයේ ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 59 ක් වන හරස්ගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මාතලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි

## 11. හදිසි ගින්නක් - ඇල්ල පොලිස් වසම.

2024.09.13 වන දින සවස් කාලයේදී ඇල්ල පොලිස් වසමේ පුංචි ශ්‍රී පාද කන්දේ හදිසි ගින්නක් හටගෙන ඇති බවට ඇල්ල පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

මෙම ගින්න ඇල්ල පොලිස් වසමේ පස්සර පාර රාවනා ඇල්ල රක්ෂිතයට අයත් කඳු කොටසක හටගෙන ඇති අතර ඇල්ල පොලිසිය, වනජීවි සංරක්ෂණ නිලධාරීන් හා ප්‍රදේශවාසීන් එක්ව ගින්න මැඩපැවත්වීමට කටයුතු කර ඇති අතර ගින්න හේතුවෙන් ජීවිත හානි කිසිවක් සිදුව නොමැත.

ගින්නට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර ඇල්ල පොලිසිය වැඩිදුර විමර්ශනය සිදුකරනු ලබයි.

## 12. මෘත ශරීරයක් හමුවීම - කලවංචිකුඩි පොලිස් වසම.

2024.09.13 වන දින උදෑසන කාලයේ කලවංචිකුඩි පොලිස් වසමේ තේත්තාතිව් පොදු සුසාන භූමියේ පිරිමි මළ සිරුරක් ඇති බවට ලද පණිවිඩයක් මත කලවංචිකුඩි පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 33 ක් වන තේත්තාතිව්, කලවංචිකඩි ප්‍රදේශයේ පදිංචිකරුවෙකු බවට හඳුනාගෙන ඇත.**

මෙම මරණය මීට දින කිහිපයකට පෙර සිදුව ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදි අනාවරණ වී ඇති අතර මරණයට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. මෘත ශරීරය සම්බන්ධ මහේස්ත්‍රාත් පරීක්ෂණය සඳහා මෘත ශරීරය පොලිස් ආරක්ෂාව යටතේ සිද්ධිය වූ ස්ථානයේ ඇති අතර කලවංචිකුඩි පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**13. මාරක රිය අනතුරක් - බොරැල්ල පොලිස් වසම.**

2024.09.13 වන දින දහවල් කාලයේ බොරැල්ල පොලිස් වසමේ ඇල්විටිගල මාවත කොස්වත්ත පාර හන්දිය අසලදී කනත්ත වටරවුම දෙස සිට නාරාහේන්පිට දෙසට ධාවනය වූ යතුරු පැදියක් දකුණු පසින් ඉස්සර කිරීමට ගිය ලොරි රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදිය පෙරළී ගොස් පැදිකරු ලොරි රථයට යටවී බරපතල තුවාල ලබා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 19 ක් වූ පිළියන්දල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුර සම්බන්ධයෙන් ලොරි රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. බොරැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**14. මාරක රිය අනතුරක් - කරන්දෙණිය පොලිස් වසම.**

2024.09.13 වන දින රාත්‍රී කාලයේ කරන්දෙනිය පොලිස් වසමේ අම්බලන්ගොඩ ඇල්පිටිය මාර්ගයේ 06 කණුව හන්දිය අසලදී ඇල්පිටිය දෙස සිට අම්බලන්ගොඩ දෙසට ධාවනය වූ යතුරු පැදියක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරු පැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරු පැදියේ පසුපැදිකරු බොරකන්ද රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 41 ක් වූ කරන්දෙනිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ඇල්පිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුර සම්බන්ධයෙන් මියගිය පසුපැදිකරු රැගත් යතුරු පැදියේ පැදිකරු අත්අඩංගුවට ගෙන ඇති අතර අනෙක් යතුරුපැදිකරු බලපිටිය රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබයි. කරන්දෙනිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**15. මාරක රිය අනතුරක් - කයිට්ස් පොලිස් වසම.**

2024.09.13 වන දින සවස් කාලයේ කයිට්ස් පොලිස් වසමේ ආරාලි කුරිකට්ටුවාන් මාර්ගයේ අරාලි හන්දිය ආසන්නයේදී වේලනි දෙස සිට අරාලි දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව දකුණු පසට ධාවනය වී ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරු පැදියක ගැටී මාර්ගයේ ඇදී ගොස් නවතා තිබූ ජේසීබී යන්ත්‍රයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරු පැදි දෙකෙහි පැදිකරු හා පැදිකාරිය තුවාල ලබා යාපනය රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වූ පුංකුඩතිව් ප්‍රදේශයේ පදිංචි පොලිස් කොස්තාපල්වරයෙකි.**

මෘත ශරීරය යාපනය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කයිට්ස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**16. මාරක රිය අනතුරක් - කළුතර උතුර පොලිස් වසම.**

2024.09.13 වන දින සවස් කාලයේ කළුතර උතුර පොලිස් වසමේ කළුතර හොරණ මාර්ගයේ බටවත්ත ප්‍රදේශයේදී කළුතර දෙස සිට හොරණ දෙසට

ධාවනය වූ වෑන් රථයක් රියදුරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන ගලවල ඇලට පෙරළී වෑන් රථය ජලයේ ගිලී අනතුරක් සිදුව ඇත. අනතුරින් වෑන් රථයේ ගමන් කල රියදුරු, රියදුරුගේ පියා සහ මව තුවාල ලබා ගල්පාත රෝහලට ඇතුලත් කිරීමේදී රියදුරුගේ පියා මියගොස් ඇත. තුවාලකාරිය වැඩිදුර ප්‍රතිකාර සඳහා හොරණ රෝහල වෙත මාරුකර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 69 ක් වූ පොකුණුවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය නාගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කළුතර උතුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**